# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2008 ජනවාරි මස 25 වන දින

### II වන කොටස

### අතිරේකය

(2008.01.28 දින නිකුත් කරන ලදී)

## ගෝසාතක (සංශෝධන)

**ගෝසාතක ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 5.25 යි** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## නීතිය බලපෑමේ ප්‍රකාශය

මේ පනත් කෙටුම්පත මගින් ගෝඝාතක ආඥාපනත සංශෝධනය කිරීමට අපේක්ෂා කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වන්නේ ගර්භනී ගව දෙනුන් හා කිරි දෙනුන් ඝාතනය කිරීම තහනම් කිරීම සහ ඒ සඳහා වරදකරුවකුට රුපියල් පනස් දහසක දඩයකින් හෝ වසර තුනක් නොඉක්මවන සිර දඬුවමකින් දඬුවම් කිරීමට විධිවිධාන සැලැස්වීම වේ.

## ගෝඝාතක (සංශෝධන)

එල්.ඩී.—ඕ. 9/2008.

### ගෝඝාතක ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2008 අංක දරන ගෝඝාතක (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

272 වන අධිකාරයේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (272 වන අධිකාරය වූ) ගෝඝාතක ආඥාපනතේ 18 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත සඳහන් උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1) (බලපත්‍රලාභී ගෝඝාතකයකු නොවන) කිසිදු පුද්ගලයකු විසින් නිසි අධිකාරයකින් ලබාගත් බලපත්‍රයක් නොමැතිව කිසිදු ගවයකු ඝාතනය කිරීම නීත්‍යානුකූල නොවන්නේ ය :

එසේ වුවද අධිකාරයකින් ලබාගත් බලපත්‍රයක් ඇතිව හෝ නැතිව ගර්භනී ගව දෙනුන් හෝ කිරි දෙනුන් ඝාතනය නොකළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තිය, (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ; සහ

(2) නැවත අංක යොදන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් නව උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(2) 18 වන වගන්තියේ (1) වන උප වගන්තියෙහි ප්‍රතිපාදන වලට පටහැනිව ගර්භනී ගව දෙනුන් හෝ කිරි දෙනුන් ඝාතනය කරනු ලබන ඕනෑම පුද්ගලයකු, වරදකට වරදකරු වන අතර, රුපියල් පනස් දහසක දඩයකට සහ වසර තුනකට නොවැඩි දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.".

**4.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.